# මානව සම්පත් සංවර්ධන

# සැලැස්ම

# 2026

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
හෙට්ටිපොල

පටුන

හැදින්වීම........................................................................................................................ 1

01 සංවිධානය
1.1 ආයතනයේ නම...................................................................................................... 2
1.2 ආයතනයේ දැක්ම.................................................................................................. 2
1.3 මෙහෙවර.............................................................................................................2
1.4 අරමුණ................................................................................................................2
1.5 කාර්යයන්.............................................................................................................2
1.6 ආයතනය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය..........................................................................2

02.ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සඳහා වූ:
2.1 දැක්ම..................................................................................................................3
2.2 මෙහෙවර.............................................................................................................3
2.3 අගයන්................................................................................................................3
2.4 අරමුණු................................................................................................................3
2.5 අගයන්................................................................................................................3

3. ආයතනයේ මානව සම්පත
3.1 ආයතනයේ කාර්ය මණ්ඩල තොරතුරු විශ්ලේෂණය...........................................................4
3.2 ආයතනයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා පුරෝකථනය............................................................4
3.3 පවතින පුරප්පාඩු ඉදිරි වර්ෂය තුල පිරවීම සඳහා වන සැලැස්ම...........................................4
3.4 ආයතනයේ මානව සම්පත් තිරස් ලෙස විශ්ලේෂණය..........................................................4
3.5 මානව සම්පත කණ්ඩායම්ගත කිරීම හා සංඛ්‍යාත්මක දැක්වීම...............................................4

4.කාර්ය මණ්ඩල හැකියා විශ්ලේෂණය
4.1කණ්ඩායම1 - ප්‍රාථමික ශ්‍රේණිය -ශිල්පීය නොවන (PL1)..................................................................
4.2 කණ්ඩායම2 - ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන (PL3)..............................................................
4.3 කණ්ඩායම3 - කණ්ඩායම තාක්ෂණික නොවන බහුකාර්ය (MN2)....................................................
4.4 කණ්ඩායම 4 - කණ්ඩායම තාක්ෂණික නොවන තාක්ෂණික (MN3)...............................................
4.5 කණ්ඩායම 5 - ආශ්‍රිත(MN4)........................................................................................................
4.6 කණ්ඩායම 6 - කළමනාකරණ සහකාර අධිපත්තිය(MN7)..............................................................

5.පුහුණු වැඩසටහන් වලට අමතරව හදුනාගත් අනෙකුත් මානව සංවර්ධන වැඩසටහන්......................

6. පුහුණු වැඩසටහන් විශ්ලේෂණය
6.1 ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා යෝජිත ප්‍රහුණු වැඩසටහන්(PL1)
6.1.1 කණ්ඩායම 01,02..........................................................................................................

6.1.2 අදාල සේවා ගණය සහ අදාල තනතුර.......................................................................................

6.1.3 මූලික පුහුණු වැඩසටහන් - කණ්ඩායම 01(PL1), 02(PL 3)...........................................................

6.1.4 තාක්ෂණික පුහුණු වැඩසටහන්කණ්ඩායම(PL1)..................................................................................

6.1.5 තාක්ෂණික පුහුණු වැඩසටහන්කණ්ඩායම (PL 3)................................................................................

6.2 ද්විතීය මට්ටමේ තනතුරු සඳහා යෝජිත පුහුණු වැඩසටහන් (MN2, MN3, MN4)

6.2.1 කණ්ඩායම 04,05,06.................................................................................................................

6.2.2අදාල සේවා ගණය සහ අදාල තනතුර.......................................................................................

6.2.3 තාක්ෂණික පුහුණු වැඩසටහන්කණ්ඩායම 04(MN2).........................................................................

6.2.4 තාක්ෂණික පුහුණු වැඩසටහන්කණ්ඩායම 05(MN3)..........................................................................

6.2.4 තාක්ෂණික පුහුණු වැඩසටහන්කණ්ඩායම 06(MN4).........................................................................

6.3 තෘතීය මට්ටමේ තනතුරු සඳහා යෝජිත පුහුණු වැඩසටහන්(MN7)....................................................

6.3.1 කණ්ඩායම 07..........................................................................................................................

6.3.2 අදාල සේවා ගණය සහ අදාල තනතුර.......................................................................................

6.2.3 තාක්ෂණික පුහුණු වැඩසටහන්කණ්ඩායම 06(MN7)...................................................................

7.මානව සම්පත් දින දර්ශනය.......................................................................................................

**පඹුවස්නුවර ප්‍රාදේශීය සභා**
**ලේකම්ගේ පණිවිඩය.**

පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම (2026) හඳුන්වා දීමට ලැබීම පිළිබඳව ප්‍රථමයෙන් මාගේ සතුට ප්‍රකාශකර සිටිමි.

මෙහිදී කාර්යාලීය නිලධාරීන්ගේ දැනුම, කුසලතා ,ආකල්ප හා හැකියාවන් පෝෂණය කිරීම හා වර්ධනය කිරීම උදෙසා උපාය මාර්ගික ප්‍රවේශයක් ගෙනහැර දක්වයි.ඉලක්කගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් නිලධාරීන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ප්‍රවේශයක් ලබා ගැනීමටත් ,දැනුම හා කුසලතා වර්ධනය කරගැනීම තුළින් ආයතනයේ අරමුණු වඩාත් ඵලදායි ලෙස බල ගැන්වීමටත්, ආකල්ප සංවර්ධනය තුළින් ශ්‍රමබලකායේ භූමිකාවන්හි විශිෂ්ඨත්වය විහිදා දැක්වීමටත් අවස්ථාව සැලසෙනු ඇත.

වර්තමානයේ සීඝ්‍රයෙන් වෙනස්වන ලෝකය තුල අභියෝගවලට මුහුණ දීම සඳහා අනුවර්තනය වීම හා නවීකරණය  වීම අත්‍යාවශ්‍ය කරුණකි.ඒ සඳහා අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියක් සහ පුහුණු හා සංවර්ධන සංස්කෘතියක් පෝෂණය කිරීමෙන් අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි ශ්‍රම බලකායක් නිර්මාණය කළ හැකි වන්නේය.ඒ සඳහා මෙම මානව සම්පත් සංවර්ධන සැලැස්ම  හරහා ක්‍රියාත්මක වන පුහුණු වැඩසටහන් තුළින් කාර්යාලයේ නිලධාරීන් දිරිමත් කිරීමටත් ,අභිප්‍රේරණය කිරීමටත් බලාපොරොත්තු වන අතර අවසාන වශයෙන් නිලධරයන් කාර්යක්ෂමව හා සඵලදායිව ක්‍රියා කිරීම තුල විශිෂ්ඨ මහජන සේවාවක් ඉටු කරනු ඇතැයි හුදෙක් මා අපේක්ෂා කරමි.

ඒ.එස්.එම්.ප්‍රනාන්දු,
පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල,

**පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ**
**ගරු සභාපතිතුමාගේ පණිවිඩය.**

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2026 වසර සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව වඩාත් සතුටු වෙමි.

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මානව සම්පත කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා, ඉහළ අගයක් කරා රැගෙනයාම මූලික අරමුණ කරගනිමින් ආයතනයේ ඵලදායිතාවය ඉහළ තලයක පවත්වා ගැනීම මේ මඟින් අපේක්ෂා කෙරේ.ඒ තුළින් ආයතනයේ මානව සම්පත සතු දැනුම ,දක්ෂතා හා විශේෂ හැකියාවන් තුළින් බල ප්‍රදේශයේ ජනතාව වෙත වඩාත් ඵලදායි සේවාවක් ලබාදීම මෙහි මූලික අරමුණ වේ.

දිනෙන් දින අළුත් වන ලෝකය තුළ පඬුවස්නුවර ප්‍රාදේශීය සභා ශ්‍රම බළකායද වර්තමාන ලෝකය තුළ අසරණ නොවී දැනුම, බුද්ධිය හා කුසලතා යාවත්කාලීන කර ගැනීමට අත්වැලක් සැපයීමද ,නිලධාරීන් දිරිමත් කිරීමද, අභිප්‍රේරණය කිරීමද මූලික අරමුණු කරගනිමින් බල ප්‍රදේශයේ ජනතාව වෙත ඵලදායි සේවයක් ලබාදීමට හැකිවේවායි සුභාසිංසන ලබාදෙන අතරම ඒ සඳහා අවශ්‍ය ඉදිරි පියවර සඳහා සාර්ථක ප්‍රවේශයක් ලබාගනු ඇතැයි මා ඉතා විශ්වාසනීය ලෙස බලා පොරොත්තු වෙමි.

වයි.ජී.සංජීව කරුණාසාගර,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල,

## හැඳින්වීම.

ඓතිහාසික පුරාවෘත්තාන්ත රැසකට උරුමකම් කියන පඬුවස්නුවර පුරවරය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ග කි.මී.287 ක භූමි වපසරියක පිහිටා ඇත.උන්මාදචිත්‍රා කුමරිය සහ එක්ටැම්ගෙය එක්ව ගොඩනැගුනු පුරාවෘත්තාන්ත රැසක් කේන්ද්‍රකර ගනිමින් වඩාත් ප්‍රසිද්ධියට පත්වූ ඓතිහාසික පුරවරයක් ලෙසට පඬුවස්නුවර රාජධානිය හඳුන්වා දිය හැකිය.සිංහල රාජාවලියේ එන විජය රජුගෙන් පසුව රාජ්‍යත්වය භාරගනු ලැබූ පඬුවස්දෙව් රජු නැතහොත් පණ්ඩුකාභය රජු ක්‍රි.පූ.5 වන සියවසේදී පමණ සිය රාජධානිය ලෙස පවත්වාගෙන යනු ලැබුවේ පඬුවස්නුවර පුරවරය බව පුරා වෘත්තාන්තයන්හි කියවේ.මේ සම්බන්ධයෙන් මේ වන විට විවිධ මතවාද දක්නට ලැබුනද ඓතිහාසික වශයෙන් මෙන්ම භූගෝලීය වශයෙන්ද මිලකළ නොහැකි වටිනාකම් වලින් අනූන වූ සශ්‍රීකත්වයෙන් ඔද වැඩුනු පුරවරයක නටබුන් මේවන විටද දක්නට ලැබේ.

මේ අයුරින් විසිරී පැතිරුණු වටිනාකම් රාශියකට උරුමකම් කියන මෙම ඓතිහාසික පුරවරය ග්‍රාම නිලධාරි වසම් 103කින් සුසැදි අතර මුළු ජනගහනය 105200 ක පමණ පිරිසකගෙන් සමන්විත වේ. බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා දැනුමින් ,කුසලතා වලින් පරිපූර්ණ කාර්යමණ්ඩලයක් ආයතනය සතුවීම අත්‍යාවශ්‍යය.ඒ අරමුණින් රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2018.01.24 දින නිකුත් කරන ලද චක්‍රලේඛ 02/2018 මඟින් හා 2023.11.30 දිනැති 02/2018(1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් හඳුන්වාදෙනු ලැබූ මාර්ගෝපදේශයට අනුව මෙම මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස්කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කරමි.වඩාත් ඵලදායි රාජ්‍ය සේවයක් තුළින් රට ගොඩනැගීමට උරදීම මෙමඟින් අපේක්ෂා කරමි.

**01.සංවිධානය**

- ආයතනයේ නම :- පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
- ආයතනයේ දැක්ම :- සමෘධිමත් පුරවරයක්
- ආයතනයේ මෙහෙවර :- පඩුවස්නුවර පුරවරය තුළ ජනතාවගේ සියලු පහසුකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කාර්යක්ෂම වූ හා විශිෂ්ඨ වූ සේවාවක් ලබා දීමට ඇප කැප වෙමින් සමෘධිය ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු කිරීම අපගේ මෙහෙවර වන්නේය.
- ආයතනයේ අරමුණ :- පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ සුබ විහරණය ,පහසුව ,සහ සුභසාධනය ඇතුළු සියළු පහසුකම් ආරක්ෂා කරමින් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගී සේවා හා මං මාවත් වලට අදාළ කටයුතු ආරක්ෂා කරමින් , ප්‍රවර්ධනය කරමින් , සියලු කටයුතු විධිමත් කරමින් පාලනය හා පරිපාලනය කරමින් කරමින් ප්‍රශස්ථ මහජන සේවා සපයන ආයතනයක් වීම අපගේ අරමුණයි.
- කාර්යයන් හා කර්තව්‍යන් උපතේ සිට මරණය දක්වා , පොදු මහජනතාවගේ බලාපොරොත්තු , අභිමතාර්ථ , සම්පූර්ණ කිරීම , යහපත් ජනතා සේවාවක් තුළින් තෘප්තිමත් පාරිභෝගික සේවාවක්.
- ආයතනය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය :-ඉහත කාර්යයන් සඳහා මානව සම්පත් හා භෞතික සම්පත් සම්පාදනය කිරීම
- පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාවගේ ජනතා අවශ්‍යතා සම්පූර්ණ කරලීම , බල ප්‍රදේශයේ මං මාවත් ,සනීපාරක්ෂක සේවාවන් ,සුභ සාධන වැඩසටහන් ආදී කාර්යයන් සපුරාලීම.

**02.ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සඳහා වූ**

- **දැක්ම**
    - පළාත් පාලන ආයතන අතුරින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මානව සම්පත් සංවර්ධනයේ විශිෂ්ඨයා වීම.

- **මෙහෙවර**

- පුරවැසි ප්‍රඥප්තියට අනුව සේවාලාභීන්ට උසස් සේවාවන් ලබාදීම උදෙසා සේවාවන් ලබාදීම උදෙසා උදෙසා සේවාවන් ලබාදීම උදෙසා අවශ්‍ය පහසුකම් නිලධාරීන් වෙත සැපයීම හා කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- ආයතනික කාර්යන් නිසි පරිදි ඉටු කිරීම සඳහා වන වගකීම් නිලධාරීන් වෙත පැවරීම.
- මහජන හිතෛෂී රාජ්‍ය සේවාවක් උදෙසා නිලධාරීන් මනා දැනුමින් සන්නද්ධ කිරීම.
- සේවාලාභීන් වෙත සපයනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ගුණාත්මක සේවාවක් බවට පත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන මෙවලම් හා නවීන ක්‍රමෝපායන් භාවිතා කිරීම.

- **අභිමතාර්ථ**

- ආයතනයේ නිලධාරීන් දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම උදෙසා තිරසාර සංවර්ධන ඉලක්ක පෙරදැරි කරගත් අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියක් මෙන්ම වෘත්තිය සංවර්ධනය උදෙසා වන පුහුණු සංස්කෘතියක් නිර්මාණය මෙහිදී නිලධාරින්ගේ කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදය වඩාත් අර්ථවත් අයුරින් භාවිතා කිරීමට උනන්දු කිරීම.
- රාජ්‍ය සේවය ඉතා කාර්යක්ෂමව හා සඵලදායිතාව ඉහළ නැංවීම උදෙසා ආයතන නිලධාරීන්ගේ නිපුණතා හා සුවිශේෂ හැකියාවන් ආයතනයේ අභිවෘද්ධිය උදෙසා ලබා ගැනීම .
- ජනතා කේන්ද්‍රිය රාජ්‍ය සේවයක් හා මහජනතාව වෙත වඩාත් උසස් සේවාවක් ලබාදීමේ පරමාර්ථයෙන් ආයතනයේ නිලධාරීන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සහතික කිරීම.

- **අරමුණු**

- පුරවැසි ප්‍රඥප්තියට අනුව සේවාලාභීන්ට උසස් සේවාවක් ලබාදීම උදෙසා අවශ්‍ය පහසුකම් නිලධාරීන් වෙත සැපයීම හා කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- ආයතනික කාර්යයන් නිසි පරිදි ඉටු කිරීම සඳහා වන වගකීම් නිලධාරීන් වෙත කැඳවීම.
- මහජන හිතෛෂී රාජ්‍ය සේවාවක් උදෙසා නිලධාරීන් මනා දැනුමින් සන්නද්ධ කිරීම.
- සේවාලාභීන් වෙත සපයනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ගුණාත්මක සේවාවක් බවට පත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන මෙවලම් හා නවීන ක්‍රමෝපායන් භාවිතා කිරීම.

- නිලධාරීන්ට අවශ්‍ය නිපුණතා හඳුනා ගැනීම ,පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීම ,නිපුණතා පරතරය හඳුනා ගැනීම ,පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- නිපුණතා හඳුනාගෙන කිසිදු භේදයකින් තොරව සියල්ලටම සමාන පුහුණු හා ඉගෙනුම් අවස්ථා ලබාදීම.
- ආයතනයේ නිලධාරීන්ගේ සුවිශේෂී වූ නිපුණතා හඳුනා ගැනීම හා එම නිපුණතා ඇගයීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.(වාර්ෂිකව බක්මහ උළෙලක් පැවැත්වීම,වාර්ෂිකව සේවක අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.)

- **අගයන්**

- විනය ගරුකව කටයුතු කිරීම.
- රාජකාරී පිළිබඳ නිසි අවබෝධයෙන් කටයුතු කිරීම.
- මහජනතාව කෙරෙහි සහකම්පනයෙන් යුතුව කටයුතු කිරීම.
- සෑම ප්‍රතිලාභියකුටම සමානව සැලකීම.

.

03.ආයතනයේ මානව සම්පත

3.1 ආයතන කාර්ය මණ්ඩලයේ තොරතුරු විශ්ලේෂණය .

| සේවා මට්ටම | තනතුර | අදාල වන සේවය | ශ්‍රේණිය | වැටුප් කේතය | 2025 දෙසැම්බර් 31 වන දිනට නිලධර සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| සම්පූර්ණ තනතුරු සංඛ්‍යාව | | | | | අනුමත | අනියුක්ත | අතිරික්ත | පුරප්පාඩු |
| තෘතීක මට්ටම | ලේකම් | පරිපාලන සේවය | Supra | MN7-2016 | 1 | 1 | 0 | 0 |
| ද්විතීය මට්ටම | සංවර්ධන නිලධාරි-GT | ස.නි.සේ. | Iii/ii/i | MN4-2016 | 7 | 7 | 0 | 0 |
| | සංවර්ධන නිලධාරි-GT | | III/II/I | MN4-2016 | 0 | 43 | 43 | 0 |
| | සංවර්ධන නිලධාරි-2022New | | III/II/I | MN4-2016 | 0 | 8 | 8 | 0 |
| | තාක්ෂණ නිලධාරි (Civil) | ශ්‍රී.ල.තා.සේ. | III/II/I | MN3-2016 | 3 | 3 | 0 | 0 |
| | පුස්තකාලාධිපති | | III/II/I | MN3-2016 | 5 | 0 | 0 | 5 |
| | කළමනා කරණ සේවා නිලධාරී | ක.සේ.නි.සේ. | III/II/I | MN2-2016 | 13 | 13 | 0 | 0 |
| | ආදායම් පරීක්ෂක නිලධාරි | දෙපාර්තමේන්තු | III/II/I | MN1-2016 | 3 | 2 | 0 | 1 |
| | පෙර පාසල් ගුරු | | III/II/I | MN1-2016 | 2 | 0 | 0 | 2 |
| | වැඩ පරිපාලක | | III/II/I | MN1-2016 | 1 | 0 | 0 | 1 |
| | සෞඛ්‍ය වැඩ අධීක්ෂක | | III/II/I | MN1-2016 | 1 | 0 | 0 | 1 |
| 1ප්‍රාථමික මට්ටම | රියදුරු | ඒකාබද්ධ සේවය | III/II/I/Spl | PL3-2016 | 6 | 4 | 0 | 2 |
| | බර වාහන රියදුරු | දෙපාර්තමේන්තු | III/II/I/Spl | PL3-2016 | 2 | 2 | 0 | 0 |
| | විදුලි කාර්මික | | III/II/I/Spl | PL2-2016 | 1 | 1 | 0 | 0 |
| | ප්‍රජා ශාලා භාරකරු | | III/II/I/Spl | PL1-2016 | 1 | 1 | 0 | 0 |
| | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පළාත් පාලන ආයතනයට බැඳීම | | | | | | | | |
| ප්‍රාථමික මට්ටම | පුස්තකාල සහායක | දෙපාර්තමේන්තු | III/II/I/Spl | PL1-2016 | 6 | 6 | 2 | 0 |
| | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | III/II/I/Spl | PL1-2016 | 4 | 4 | 0 | 0 |
| | මාර්ග කම්කරු(වැඩ ක්ෂේත්‍ර කම්කරු) | දෙපාර්තමේන්තු | III/II/I/Spl | PL1-2016 | 30 | 27 | 0 | 3 |
| | මුරකරු | | III/II/I/Spl | PL1-2016 | 4 | 4 | 0 | 0 |
| | සෞඛ්‍ය කම්කරු | දෙපාර්තමේන්තු | III/II/I/Spl | PL1-2016 | 12 | 11 | 0 | 1 |
| | ජලනල කාර්මික | | III/II/I/Spl | PL1-2016 | 1 | 0 | 1 | 1 |
| | රියදුරු* | | III/II/I/Spl | PL2-2016 | 1 | 1 | 0 | 0 |
| | පුස්තකාල සහායක* | | III/II/I/Spl | PL1-2016 | 1 | 1 | 0 | 0 |
| | මුරකරු* | | III/II/I/Spl III/II/I/Spl | PL1-2016 | 1 | 1 | 0 | 0 |
| | සෞඛ්‍ය කම්කරු | | III/II/I/Spl | PL1-2016 | 5 | 5 | 0 | 0 |
| | පෙර පාසල් සහායක* | | III/II/I/Spl | PL1-2016 | 1 | 1 | 0 | 0 |
| | ජලනල කාර්මික# | | III/II/I/Spl | PL1-2016 | 1 | 1 | 0 | 0 |
| | පෙර පාසල් සහායක# | | III/II/I/Spl | PL1-2016 | 0 | 2 | 0 | 0 |
| | ආදාහනාගාර කම්කරු## | | III/II/I/Spl | PL1-2016 | 0 | 1 | 1 | 0 |
| | පුස්තකාල සහායක## | | III/II/I/Spl | PL1-2016 | 0 | 4 | 4 | 0 |
| | පෙර පාසල් සහායක## | | III/II/I/Spl | PL1-2016 | 0 | 1 | 1 | 0 |
| | එකතුව | | Iii/ii/spl | PL-2016 | 112 | 155 | 60 | 17 |

*දරන්නාට පුද්ගලික වන තනතුරු

#25/2014 &25/2014(ආ)චක්‍ර ලේඛ යටතේ

3.2 .ආයතනයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා පුරෝකථනය

| සේවා මට්ටම | තනතුර | අදාල වන සේවය | ශ්‍රේණිය | ඉදිරි කාර්ය මණ්ඩල අවශ්‍යතා | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැටුප් කේතය | නව තනතුරක් ඇති කිරීම | අනුමත නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීම | අනුමත නිලධාරීන් සංඛ්‍යාව අඩු කිරීම | තනතුර යටපත් කිරීම | තනතුර අහෝසි කිරීම |
| තෘතීය මට්ටම | ලේකම් | | | MN 7 | | | | | |
| ද්විතීය මට්ටම | සංවර්ධන නිලධාරි | ස.නි.සේ | 111/11/1 | MN 4 | | | | | |
| | කළමනාකරණ සේවා නිලධාරී | කළ.සේ.නි.සේ. | 111/11/1 | MN 2 | | | | | |
| | කාර්මික නිලධාරී | ශ්‍රී.ලං.තා.සේ. | 111/11/1 | MN 3 | | | | | |
| | පුස්තකාලාධිපති | | 111/11/1 | MN 3 | | | | | |
| | ආදායම් නිලධාරී | | 111/11/1 | MN 1 | | | | | |
| | පෙර පාසල් ගුරු | | 111/11/1 | MN 1 | | | | | |
| | වැඩ පරිපාලක | | 111/11/1 | MN 1 | | | | | |
| | සෞඛ්‍ය වැඩ අධීක්ෂක | | 111/11/1 | MN 1 | | | | | |
| | එකතුව | | | | | | | | |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 111/11/1 | PL 3 | | | | | |
| | ජලනල කාර්මික | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 2 | | | | | |
| | විදුලි කාර්මික | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 2 | | | | | |
| | කාර්යාල සේවක සේවය | කා.සේ.සේ. | 111/11/1 | PL 1 | | | | | |
| | බරවාහන ක්‍රියාකරු | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 2 | | | | | |
| | ප්‍රජාශාලා භාරකරු | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 1 | | | | | |
| | ආදාහනාගාර කම්කරු | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 1 | | | | | |
| | මාර්ග කම්කරු | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 1 | | | | | |
| | මුරකරු | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 1 | | | | | |
| | සෞඛ්‍ය කම්කරු | දෙපාර්තමේන්තු ගත 25/2014 | 111/11/1 | PL 1 | | | | | |
| | එකතුව | | | | | | | | |

මධ්‍යස්ථාන භාර නිලධාරි .කම්කරු යන තනතුරු සඳහා යම් වන විටත් නව තනතුරු ඇති කර තිබෙන අතර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය කොමිෂන් සභාවේ තීරණය මත නිලධරයන් අඩු/වැඩි වීම මත ඉදිරි කාර්යයමණ්ඩල අවශ්‍යතාව තීරණය වේ.

3.3 පවතින පුරප්පාඩු ඉදිරි වර්ෂය තුළ පිරිවීම සඳහා වන සැලැස්ම.

| සේවා මට්ටම | තනතුර | අදාල වන සේවය | ශ්‍රේණිය | වැටුප්කේතය | ඉදිරි කාර්ය මණ්ඩල අවශ්‍යතා | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අනුමත | සත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත | පුරප්පාඩුවන | පුරප්පාඩු පුරවන |
| තෘතීය මට්ටම | ලේකම් | | | MN7 | 01 | 01 | * | | සේවයේ අවශ්‍යතාවය මත තීරණය වේ.ස්ථාන මාරුවී පැමිණෙන නිලධාරීන් මගින් රාජකාරී ආවරණය /වැඩ බැලීම හෝ ඇනට පවත්නා කාර්ය මණ්ඩලය මගින් රාජකාරී ඉටුකර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. | |
| ද්විතීය මට්ටම | සංවර්ධන නිලධාරි | සං.නි.සේ. | 111/11/1 | MN4 | 07 | 43 | | 43 | | |
| | කළමනාකරන සේවා නිලධාරි | කළ.සේ.නි.සේ. | 111/11/1 | MN2 | 13 | 13 | | | | |
| | කාර්මික නිලධාරි | ශ්‍රී.ලං.තා.සේ. | 111/11/1 | MN3 | 03 | 03 | | | | |
| | ආදායම් පරීක්ෂක නිලධාරි | | 111/11/1 | MN3 | 03 | 02 | | | | |
| | පෙර පාසල් ගුරු | | 111/11/1 | MN1 | 02 | | 2 | | | |
| | වැඩ පරිපාලක | | 111/11/1 | MN1 | 01 | | 1 | | | |
| | සෞඛ්‍ය වැඩ අධීක්ෂක | | 111/11/1 | MN1 | 01 | | 1 | | | |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 111/11/1 | PL3 | 06 | 04 | 2 | | සේවයේ අවශ්‍යතාවය මත තීරණය වේ.ස්ථාන මාරුවී පැමිණෙන නිලධාරීන් මගින් රාජකාරී ආවරණය /වැඩ බැලීම හෝ | |
| | ජලනල කාර්මික | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL2 | 01 | | 1 | | | |
| | විදුලි කාර්මික | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL2 | 01 | 01 | | | | |
| | කාර්යාල සේවක සේවය | කා.සේ.සේ. | 111/11/1 | PL1 | 04 | 04 | | | | |
| | බරවාහන ක්‍රියාකරු | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL1 | 02 | 02 | | | | |
| | ප්‍රජාශාලා භාරකරු | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL1 | 01 | 01 | | | | |
| | ආදාහනාගාර කම්කරු | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL1 | | | | 01 | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර්ග කම්කරු | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL1 | 30 | 27 | 3 | | ඇනට පවත්නා කාර්ය මණ්ඩලය මඟින් රාජකාරී ඉටුකර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ | |
| | මුරකරු | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL1 | 01 | 01 | | | | |
| | සෞඛ්‍ය කම්කරු | දෙපාර්තමේන්තු ගත | 111/11/1 | PL1 | 12 | 11 | 1 | | | |
| | රියදුරු * | දෙපාර්තමේන්තු ගත - 25/2014 | 111/11/1 | PL1 | 01 | | | | | |
| | පෙර පාසල් සහායක * | දෙපාර්තමේන්තු ගත - 25/2014 | 111/11/1 | PL1 | 01 | 01 | | | | |
| | පුස්තකාල සහායක* | දෙපාර්තමේන්තු ගත-25/2014 | 111/11/1 | PL1 | 01 | 01 | | | | |
| | මුරකරු* | දෙපාර්තමේන්තු ගත-25/2014 | 111/11/1 | PL1 | 01 | 01 | | | | |
| | සෞඛ්‍ය කම්කරු | දෙපාර්තමේන්තු ගත-25/2014 | 111/11/1 | PL1 | 05 | 05 | | | | |
| | ජලනල කාර්මික | | 111/11/1 | PL1 | 01 | | 1 | | | |
| | පෙර පාසල්සහායක# | දෙපාර්තමේන්තු ගත -25/2014 | 111/11/1 | PL1 | | 02 | | 02 | | |
| | ආදාහනාගාර භාරකරු ## | දෙපාර්තමේන්තු ගත -25/2014 | 111/11/1 | PL1 | 01 | | | 01 | | |
| | පුස්තකාල සහායක## | දෙපාර්තමේන්තු ගත-25/2014 | 111/11/1 | PL1 | 04 | | | 04 | | |
| | පෙරපාසල්සහායක## | දෙපාර්තමේන්තු ගත -25/2014 | 111/11/1 | PL1 | 04 | | | 01 | | |
| | මුළු එකතුව | දෙපාර්තමේන්තු ගත -25/2014 | | | 108 | 123 | 12 | 52 | | |